සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/ Ministry of Education – Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2025**

**3 ශ්‍රේණිය**

| 07 | S | I,II |
|---|---|---|

**(07) ඉතිහාසය - I, II**

**පැය එකයි.**

**අමතර කියවීම් කාලය - විනාඩි 10**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍ර කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**ඉතිහාසය - I පත්‍රය**

**සැලකිය යුතුයි:**
- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**
- ❖ **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- ❖ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැපයෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ❖ **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

➢ **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. “ඉතිහාසය එක් විෂයක් නොව විෂයන් සියල්ල අන්තර්ගත ගෘහයයි.” යන නිර්වචනය ඉදිරිපත් කළ ඉතිහාසඥයා කවුරුන් ද?

(1) ජී. එච්. ට්‍රෙව්ලියන් (3) ඩියඩෝරස්
(2) ඊ. එච්. කාර් (4) පොලිබියස්

02. ඉතිහාසය හැදෑරීමේ වටිනාකමක් නොවන්නේ මින් කුමක් ද?

(1) අතීතය හඳුනා ගැනීම. (3) අන්‍ය සංස්කෘති විවේචනය කිරීම.
(2) අන්‍ය මතවලට ගරු කිරීමට. (4) අතීතයෙන් පාඩම් උගෙනීමට.

03. ප්‍රාග් ඓතිහාසික ස්ථානයක් නොවන්නේ මින් කුමක් ද?

(1) බටදොඹ ලෙන (3) පොම්පරිප්පු
(2) බුන්දල (4) රාවණා ඇල්ල


www.piriyena.lk

04. කලුතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්ථානය කුමක් ද?

(1) අළු ලෙන
(2) බෙල්ලන්බැඳි පැලැස්ස
(3) ඉරණමඩුව
(4) පාහියන්ගල ලෙන

05. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් කීය ද?

(1) 65610 කි
(2) 65620 කි
(3) 65510 කි
(4) 65710 කි

06. උතුරේ පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව අතර දුර ප්‍රමාණය දිගින් කිලෝමීටර් කීය ද?

(1) 422 කි
(2) 433 කි
(3) 432 කි
(4) 431 කි

07. ලංකාවේ ඉතිහාසය හැඩ ගැසීම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළේ,

(1) චීනයට ආසන්නව පිහිටීමය.
(2) කාම්බෝජයට ආසන්නව පිහිටීමය.
(3) ඉන්දියාවට ආසන්නව පිහිටීමය.
(4) බුරුමයට ආසන්නව පිහිටීමය.

08. මල්වතු ඔය අසල පිහිටුවාගත් ආර්ය ජනාවාසය කුමක් ද?

(1) උරුවෙල ගාම
(2) උපතිස්ස ගාම
(3) විජිත ගාම
(4) අනුරාධ ගාම

09. පණ්ඩුකාභය රජතුමා ඉදිකළ වාරි කර්මාන්තය කුමක් ද?

(1) ජය වැව
(2) තිසා වැව
(3) නුවර වැව
(4) මින්නේරිය වැව

10. නගර ගුත්තික තනතුර යනු,

(1) රාෂ්ට්‍ර පාලනයේ ප්‍රධානියාය.
(2) දොරටු පාලකයාය.
(3) ගම් පාලනය කරන්නාය.
(4) නගරය ආරක්ෂා කිරීමේ ප්‍රධානියාය.

11. “දෙවනපිය” විරුදාවලිය ලබා අභිශේකයක් කළ පාලකයා කවුරුන් ද?

(1) පණ්ඩුකාභය රජු
(2) දේවානම්පියතිස්ස රජු
(3) කාවන්තිස්ස රජු
(4) සද්ධාතිස්ස රජු


www.pirponia.lk

12. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ කුමන රාජ්‍ය කාලයේ ද?

(1) මහානාම රජු　　(3) මහසෙන් රජු

(2) වළගම්බා රජු　　(4) දුටුගැමුණු රජු

13. අනුරාධපුර යුගයේ මහ වැව් 11 ක් සහ ඇලවල් 12 ක් ඉදිකළ ශ්‍රේෂ්ඨ පාලකයා කවුරුන් ද?

(1) ධාතුසේන රජු　　(3) වසභ රජු

(2) දෙවන අග්බෝ රජු　　(4) සද්ධාතිස්ස රජු

14. සමන්තපාසාදිකාව සහ වංසත්තප්පකාසිනි ග්‍රන්ථ රචනා කළේ,

(1) දඹදෙණි යුගයේය.　　(3) ගම්පොළ යුගයේය.

(2) කුරුණෑගල යුගයේය.　　(4) අනුරාධපුර යුගයේය.

15. "ශ්‍රී රාම චන්ද්‍රභාරතී" නම් සුප්‍රකට පඬිවරයා වැඩසිටි යුගය කුමක් ද?

(1) කුරුණෑගල　　(3) කෝට්ටේ

(2) සීතාවක　　(4) ගම්පොළ

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. (1) මූලික පිරිවෙන　　(3) විද්‍යායතන පිරිවෙන

(2) මහ පිරිවෙන　　(4) විද්‍යෝදය පිරිවෙන

17. (1) මංගණ විහාරය　　(3) සාලවාන විහාරය

(2) ථූපවට්ටි විහාරය　　(4) පබ්බතාරාමය

18. (1) කාල ප්‍රාසාද පිරිවෙන　　(3) ආලාහණ පිරිවෙන

(2) දීඝසන්ධ පිරිවෙන　　(4) පියංගු පිරිවෙන

19. (1) දළදා සිරිත　　(3) අනාගත වංසය

(2) පූජාවලිය　　(4) සිංහල බෝධි වංසය

20. (1) මයූර සන්දේශය　　(3) ගිරා සන්දේශය

(2) සැළලිහිණි සන්දේශය　　(4) හංස සන්දේශය


www.pirisara.lk

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම /ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නාම /ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම /ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) වෘක්ෂ වන්දනාව - බෝධි වන්දනාව
(2) ගිනි පූජාව - පහන් පූජාව
(3) පර්වත වන්දනාව - ස්තූප වන්දනාව
(4) සති පූජාව - අනිමිසලෝචන පූජාව

22. (1) ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි
(2) එළු අත්තනගලු වංශය - විදාගම මෛත්‍රී හිමි
(3) කෝකිල සංදේශය - ධම්මදින්න විමලකිත්ති හිමි
(4) කාව්‍යශේඛරය - තොටගමුවේ රාහුල හිමි

23. (1) රාම ගෝණ - මහවැලි ගං මෝය අසල
(2) විජිත ගාම - කනදරා ඔය අසල
(3) දීඝායු ගාම - ගල් ඔය අසල
(4) උරුවෙල ගාම - කලා ඔය අසල

24. (1) ථූපාරාමය - දේවානම්පියතිස්ස
(2) රුවන්වැලිසෑය - දුටුගැමුණු
(3) අභයගිරිය - වළගම්බා
(4) ජේතවනාරාමය - ධාතුසේන

25. (1) බුදුගුණාලංකාරය - ඛණ්ඩ කාව්‍ය
(2) රුවන්මල්දම - කෝෂ ග්‍රන්ථ
(3) එළු ශිලෝශතකය - ප්‍රශස්ති කාව්‍ය
(4) භක්ති ශතකය - සංස්කෘත ග්‍රන්ථ


www.pirigena.lk

➢ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරින් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

26. දුටුගැමුණු රජතුමාගේ කාර්ය සාඵල්‍යය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. කාවන්තිස්ස රජතුමාගේ වැඩිමහල් පුත් කුමරුය.

B. මෙතුමා වසර 24ක් රජකම් කළේය.

C. විසිමහා යෝධයන්ගෙන් සමන්විත හමුදාවක් ඇති කිරීම.

D. වෙසක් උත්සව විසිහතක් පැවැත්වීම.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

27. ඉන්දියාවට ආසන්නව පිහිටීමෙන් ඇති වූ දේශපාලන බලපෑම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට මෙන්ම සහෝදරයාගෙන් සහෝදරයට උරුම වීම.

B. රජුට උපදෙස් දුන් පුරෝහිත වෙනුවට රාජ්‍ය පාලනයේදී භික්ෂූන්වහන්සේලා රජුට උපදෙස් දීම.

C. ඉන්දියාවේ පැවති රාජාණ්ඩු ක්‍රමය ලක්දිව පාලන තන්ත්‍රයට බලපෑම.

D. ඉන්දීය සම්ප්‍රදායට අනුව මෙරට රාජාභිෂේකය පැවැත්වීම.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

28. වළගම්බා රජු මුහුණ දුන් අභියෝග සම්බන්ධව නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. මාඝගේ ආක්‍රමණය.

B. බැමිණිතියාසාය.

C. තීය බ්‍රාහ්මණයා විසින් ඇති කරන ලද කැරැල්ල.

D. හල්ලුකගේ ආක්‍රමණය.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

29. මහායාන අධ්‍යාපනය මෙරටට හඳුන්වා දීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. පාහියන් වැනි චීන භික්ෂූන් වහන්සේලා.

B. මිහිඳු මහරහතන් වහන්සේ විසින් හඳුන්වාදුන් විෂය පද්ධතිය.

C. නේවාසිකව ධර්මය කියා දීම.

D. අමෝඝවජ්‍ර නම් භික්ෂූන් වහන්සේගේ ක්‍රියා කලාපය.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය


www.pirigena.lk

30. දඹදෙණි රාජධානි සමයෙහි පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. ජේතවනාරාම පිරිවෙන ආරම්භ කිරීම.

B. මහා බෝධිවංස ගැටපදය රචනා කිරීම.

C. දෙවුන්දර නන්දන පිරිවෙන ආරම්භ කිරීම.

D. සුබෝධාලංකාර ග්‍රන්ථය රචනා කිරීම.

1. B සහ C ය 2. A සහ B ය 3. A සහ D ය 4. C සහ D ය

➢ **අංක 31 සිට 36 දක්වා ඇති නාම/ ප්‍රකාශන සමූහයේ X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම /ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුරු තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. සිවිකාසාලා | A. වළගම්බා රජු |
| 2. මිරිසවැටිය | B. දුටුගැමුණු රජු |
| 3. සෝමාවතිය | C. පණ්ඩුකාභය රජු |
| 4. මහාවිහාරය පිහිටවීම | D. දේවානම්පියතිස්ස රජු |

1. CBAD 2. CBDA 3. BCAD 4. DCBA

32.

| X | Y |
|---|---|
| 1. ජාතකට්ඨකතාව | A. කුරුණෑගල යුගය |
| 2. ධර්ම ප්‍රදීපිකාව | B. අනුරාධපුර යුගය |
| 3. අනාගත වංසය | C. පොළොන්නරුව යුගය |
| 4. පරවි සන්දේශය | D. කෝට්ටේ යුගය |

1. BCAD 2. BCDA 3. BDCA 4. DABC


www.pilipenia.lk

33. X Y

| X | Y |
|---|---|
| 1. මල්වතු ඔය | A. කදම්බ නදී |
| 2. කලා ඔය | B. මහාවාලුකා නදී |
| 3. දැදුරු ඔය | C. ජජ්ජර නදී |
| 4. මහවැලි ගඟ | D. ගෝණ නදී |

1. ADCB 2. ACDB 3. DCBA 4. BACD

34.

| X | Y |
|---|---|
| 1. මිත්තසේන රාජ්‍ය සමය | A. සත්ද්‍රවිඩ ආක්‍රමණය |
| 2. වළගම්බා රාජ්‍ය සමය | B. එළාර ආක්‍රමණය |
| 3. අසේල රාජ්‍ය සමය | C. සේනගුත්තික ආක්‍රමණය |
| 4. සූරතිස්ස රාජ්‍ය සමය | D. ෂට් ද්‍රවිඩ ආක්‍රමණය |

1. ABCD 2. DABC 3.ABCD 4. BADC

35.

| X | Y |
|---|---|
| 1. ක්‍රි. ව. 1864 | A. ගම්පොළ වාදය |
| 2. ක්‍රි. ව. 1865 | B. බද්දේගම වාදය |
| 3. ක්‍රි. ව. 1873 | C. වරාගොඩ වාදය |
| 4. ක්‍රි. ව. 1871 | D. පානදුරා වාදය |

1. ABCD 2. BCDA 3. BCDA 4. ADCB


www.pirivena.lk

➢ **අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **36** | ත්‍රිපිටකය කටපාඩමින් රැගෙන ආ මහතෙරවරු භාණක නමින් හැඳින්වේ. | කුපික්කලතිස්ස හිමිගේ ශිෂ්‍ය බහලමස්සු තිස්ස හිමිද මහා විහාරයෙන් නෙරපන ලදී. (……) |
| **37** | ඉතිහාසය යනු මානව ශිෂ්ටාචාරයේ ආරම්භය, විකාශනය හා සංවර්ධනය විස්තර කරන කථා පුවතකි. | ඉතිහාසය මිනිසුන් පිළිබඳ කෙරෙන අධ්‍යනයක් බව ඊ. එච්. කාර් පවසා ඇත. (……) |
| **38** | කොළඹ සිට සංගමන්කන්ද තුඩුව අතර දුර ප්‍රමාණය කිලෝමීටර් 222කි. | ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වෙන්නේ සැතපුම් විසි හතරක් පමණ වූ පටු මුහුදු තීරයකිනි. (……) |
| **39** | දුටුගැමුණු රජතුමා අරිට්ඨ කුමරු පැවිදි කරවීය. | මළවුන් පිදීම වෙනුවට ප්‍රාප්ති දානමය පිංකම් හඳුන්වා දෙන ලදී. (……) |
| **40** | වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයන් වහන්සේ අධ්‍යාපනය වෙනුවෙන් නියමකන්ද මුල්ම පිරිවෙන ආරම්භ කරන ලදී. | ක්‍රි. ව. 1875 විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කරන ලදී. (……) |


www.pirgama.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முப்பு பாதிப்புஜரிமையஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/ Ministry of Education – Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2025**

**3 ශ්‍රේණිය**

| 07 | S | II |
|---|---|---|

**පැය දෙකයි**

**(07) ඉතිහාසය - II පත්‍රය**

**සැ. යු.**

- ❖ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර, නම් කරන්න.

1. අනුරාධපුර 2. පොලොන්නරුව 3. මල්වතු ඔය
4. දෙවුනුවර 5. කතරගම 6. මහවැලි ගඟ

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 X 6 = 06)

II. (අ) A රූපයේ දැක්වෙන ඓතිහාසික ස්ථානය කුමක් ද?

(ආ) මෙය පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද?

(ඉ) මෙහි තිබී සොයාගත් සාධක මොනවා ද?



(ලකුණු 03) A රූපය

III. (අ) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) මෙය කුමන රජ දවස ඉදිකළ නිර්මාණයක් ද?

(ඉ) මෙය පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?



(ලකුණු 03) B රූපය


www.piriwena.lk

02. I. කෑගල්ල දිස්ත්‍රික්කයේ දැනට සොයාගෙන ඇති ප්‍රාග් ඓතිහාසික ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාව නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. I. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැසීමට බලපෑ බාහිර භූගෝලීය සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ලක්දිවට පැමිණි ප්‍රධාන භාරතීය ජන කණ්ඩායම් හතරක් දක්වන්න. (ලකුණු 04)

III. ශ්‍රී ලාංකීය සමාජයේ ඒකවරණයට හේතු වූ අභ්‍යන්තර භූගෝලීය සාධක දෙකක් පහදන්න. (ලකුණු 06)

04. I . මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුගේ බුද්ධිය පරික්ෂා කර බැලීම සඳහා යොමු කළ ප්‍රශ්න දෙක නම් කරන්න. (ලකුණු 02)

II. දේවානම්පියතිස්ස රජතුමා සිදු කළ ආගමික සේවා හතරක් දක්වන්න. (ලකුණු 04)

III. මෙතුමා සංස්කෘතික දියුණුව ඇති කිරීම සඳහා කටයුතු කළ ආකාරය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06)

05. I. වසභ රජුගේ පුතුන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

II. වසභ රජතුමාගේ දේශපාලනය, ආර්ථික හා ආගමික සේවා අධ්‍යනයට ඇති පුරාවිද්‍යා මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. "කෘෂිකාර්මික දියුණුවට මහත් සේවාවක් සිදු කළ පාලකයා වසභ රජතුමාය" මෙම කියමන කෙටියෙන් පහදන්න. (ලකුණු 06)

06. I. මිත්සෙන් රජ සමයේ දකුණු ඉන්දියාවෙන් පැමිණි ආක්‍රමනිකයන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. ධාතුසේන රජතුමාගේ පුතුන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 04)

III. මෙතුමා රජරට වාරිකර්මාන්තයේ දියුණුව සඳහා සිදුකළ සේවාව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)


www.pirivena.lk

07. I. පැල්මඩුල්ල පිරිවෙන් විද්‍යාස්ථානය තුළින් බිහිවූ උගතුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. අධ්‍යාපන කොමිෂන් සභාව සහ ප්‍රාචීන භාෂෝපකාර සමාගම පිහිට වූ වර්ෂය සඳහන් කරන්න. (ලකුණු 04)

III. ශ්‍රී ලංකාවේ පිරිවෙන් වර්ග පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ඓතිහාසික තොරතුරු විස්තර කරන්න.

1. ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන

2. කෝට්ටේ යුගයේ වැඩ සිටි සුප්‍රකට පඬිවරුන්

3. මහායාන අධ්‍යාපනයේ පරමාර්ථ

4. ලක්දිව බුදු දහම පිහිටුවීම

(ලකුණු 6 x 2 = 12)


www.pirivena.lk